**මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකයේ ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය හා දිවාසුරැකුම් මධ්‍යස්ථානය සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ මුල් ළමාවිය සංවර්ධන සහය උපදේශිකා(සහය ගුරු)/ දිවාසුරැකුම් මධ්‍යස්ථාන පාලිකා තනතුරට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීමට අදාල තොරතුරු**

මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය යටතේ කුණ්ඩසාලේ නව නගරයේ අංක 2A, ස්ථානයේ ආරම්භ කර පවත්වාගෙන යනු ලබන පළාත් ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය හා දිවාසුරැකුම් මධ්‍යස්ථානය සඳහා මුල් ළමාවිය සංවර්ධන සහය උපදේශිකා (සහය ගුරු)/ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකා තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන අයවලුන්ගෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

**තනතුර**

මුල් ළමාවිය සංවර්ධන සහය උපදේශිකා/දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකා (කොන්ත්‍රාත් පදනම මත)

**වයස**

2025.11.15 දිනට වයස අවුරුදු 18 නොඅඩු වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතු වේ.

**දීමනාව**

මෙම තනතුර රජයේ ස්ථිර තනතුරක් නොවන අතර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබයි. බඳවා ගන්නා සුදුසුකම්ලාභියා මාස 06ක පරිවාස කාලයකට යටත් වන අතර ආරම්භක දීමනාව ලෙස රු:20,000.00 දීමනාවක් ගෙවනු ලැබේ. ඉන් අනතුරුව කාර්යසාධනය සලකා බලා පාලක කමිටුව විසින් වාර්ෂිකව දීමනාව සංශෝධනය කරනු ලැබේ.

**සුදුසුකම්**

අ.පො.ස.(සා.පෙළ) විභාගය ගණිතය සහ මව් භාෂාව ඇතුලත්ව විෂයන් 06 ක් සමත් විය යුතු අතර ඉන් විෂයන් 03 කට සම්මාන සාමාර්ථ ලබා තිබීම.

සහ

සිංහල/දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය හා පරිගණක භාවිතය පිළිබඳ හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලබයි.

**වෘත්තීය සුදුසුකම්**

මුල් ළමාවිය සංවර්ධන ඒකකය විසින් පිළිගන්නා ආයතනයකින් ලබා ගන්නා ලද මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ උපාධිය හෝ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලාව, දැ අවුරුදු උසස් සහතික පත්‍ර පාඨමාලාව හදාරා තිබීම.

**පළපුරුද්ද**

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක උපදේශිකාවක (පෙර පාසැල් ගුරුවරියක) වශයෙන් වසර 10 කට නොඅඩු සේවා පලපුරුද්දක් ලබා තිබීම.

සහ

දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවක වශයෙන් වසරකට නොඅඩු සේවා පලපුරුද්දක් ලබා තිබීම.

**කායික සුදුසුකම්**

අයදුම්කාරිය මනා සහ විශිෂ්ඨ චරිතයකින් සහ තනතුරේ රාජකාරි කිරීමට ප්‍රමාණවත් මනා කායික සහ මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හෙබි තැනැත්තියක් විය යුතු වේ.

වෙනත්

අයදුම්කාරිය ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු වේ.
අයදුම්පත කැඳවන අවසන් දිනයට (2025.11.15 දිනට) පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩව මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු වේ. ( සම්මුඛ පරීක්ෂණයේදී ග්‍රාම නිලධාරි සහතිකය මගින් සනාථ කළ යුතු වේ )

තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම අතින්ම සම්පූර්ණ කර තිබිය යුතු වේ. එමෙන්ම අයදුම්කරුවන් එම සුදුසුකම් පිළිබඳ සහතිකපත් සම්මුඛ පරීක්ෂණයේදී මුල් පිටපත් සහ සහතික කරන ලද පිටපත් සමගින් ඉදිරිපත් කළ යුතු වේ.

අයදුම්පත්‍ර

අයදුම්කරුවන් සියලු විස්තර සමඟ මෙහි සඳහන් ආකෘතියට සකස් කරන ලද අයදුම්පතක්, අධ්‍යාපන සහතික, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පතහි සහ පළපුරුද්ද දැක්වෙන සහතිකවල සහතික කළ පිටපත් සමගින් **"අධ්‍යක්ෂ, පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය, අංක 2A, නව නගරය, කුණ්ඩසාලේ"** යන ලිපිනයට 2025/11/15 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ මුල් ළමාවිය සංවර්ධන ඒකක කාර්යාලයට අතින් ගෙනවිත් භාරදිය යුතු වේ.

අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවර **"මුල් ළමාවිය සංවර්ධන සහය උපදේශිකා (සහය ගුරු) / දිවාසුරැකුම් මධ්‍යස්ථාන පාලිකා තනතුර සඳහා බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු වේ.